# උපදෙස් හා නීතිරීති

01 භාවනා යෝගීන් පහත සඳහන් උපදෙස් හා නීතිරීති තරයේම අනුගමනය කළ යුතුය.

02 **පින්වත් ඔබ ගුණධර්ම සපුරා ගැනීම පිණිස පැමිණෙන මෙම ස්ථානය පුණ්‍යකාමී මහජනතාවගේ මුදලින් නඩත්තු කරනු ලැබේ. එබැවින් එම ජනතාවට පින් වැඩෙන ආකාරයෙන් මෙම ස්ථානය අවංකවම භාවනා පුහුණුව සඳහා යොදා ගැනීම,පිරිසිදුව හා ආරක්ෂිතව පරිහරණය කිරීම හා හැකි පමණින් ආධාරයක් කිරීම ඔබටද පින් වැඩෙන පුණ්‍යකර්මයවේ.**

03 අදාල අයදුම් පතක් නිසි ලෙස සම්පූර්ණ කර කම්මට්ඨානාචාර්යයන් වහන්සේ/අධිපති හිමිපාණන් ගේ **පූර්ව අවසරය ලබා ගන පැමිනිය යුතුය.**

04 පුහුණුව මසකට වරක් සඳුදා දිනක සිට සිකුරාදා දක්වා දින 05 ක් පෙව 8.00 සිට පව 5.00 දක්වා පැවැත්වේ.

05 උතුරු සළුව සහිත සුදු පාට ඇඳුම් කට්ටලයකින් සැරසී පැමිණිය යුතුය, පිඟානක්, අඩුවක් සහිත කෝප්පයක්. රැගෙන ආ යුතුය. ***ගිලන් පස සපයනු ඇත. ආහාර රැගෙන ආ යුතුය. දානය සැපයීමට පහසුකමක් උදා වුවහොත් පමණක් දන්වනු ඇත.***

06 දිනපතාම පැමිණීමේදී ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කර කාර්යාලයෙන් දෙනු ලබන අනේවාසික භාවනා හැදුනුම්පත ලබා ගන පැළඳ සිටිය යුතුය. පිටවීමේදී භාවනා හැඳුනුම්පත ආපසු කාර්යාලයට භාරදී අදාල ලේඛනයේ පිටවීම සටහන් කළ යුතුය

07 ජංගම දුරකථන තිබේනම් භාවනා මධ්‍යස්ථානයේ රැඳී සිටින කාලය තුල ක්‍රියා විරහිත කර තැබිය යුතුය

08 පුහුණු කාලය තුලදී අවම වශයෙන් උපෝසථ අට සිල් සමාදන්ව ඒ අනුව ප්‍රතිපත්ති ගරුකව පැවැතිය යුතුය.

09 මෙම පරිශ්‍රයේ මහා සංඝරත්නයද වැඩ සිටින බැවින් නිරතුරුවම සංඝ ගෞරවය පවත්වා ගනිමින් ක්‍රියා කළ යුතුය. පූජනිය සංඝරත්නය උදෙසා වෙන් කර ඇති කිසිවක් පරිහරණය කිරීමෙන් ගිහි පින්වතුන් විසින් සම්පූර්ණයෙන්ම වැලකී සිටිය යුතුය.

10 භාවනා පුහුණු කාලය තුලදී පොත්පත් කියවීම, අමුත්තන් හා ඥාතීන් හමුවීම, බැහැරින් පණිවුඩ ලබා ගැනීම හා පුද්ගලයන් ගෙන්වා ගැනීම, ජංගම දුරකථන භාවිතය, භාවනා මධ්‍යස්ථානයෙන් බැහැරට යාම අන් අය සමඟ කථා කිරීම, ආදියෙන් සම්පූර්ණයෙන්ම වැලකිය යුතුය. කාර්ය මණ්ඩලය සමඟ වුවද කථාව අත්‍යවශ්‍ය කරුණකට පමණක් සීමා කළ යුතුය

11 භාවනා ශාලාව තුලට භාවනා මේට්ටය හා පත්කඩය හැරුණු විට වෙනත් කිසිවක් රැගෙන ඒම නොකළ යුතුය.

12 ඔබගේ හැසිරීම හා පැවැත්ම අනෙක් යෝගීන්ගේ භාවනා පුහුණුවට බාධාවක් නොවන ලෙසට පැවැතිය යුතුය.

13 භාවනා පුහුණුව පිළිබඳ කාල සටහන කඩ නොකොට අනුගමනය කළ යුතුය.

14 හදිසි අසනීප ආදියකදී ප්‍රමාණවත් පහසුකම් සැපයීමේ හැකියාවක් නොමැති බව කරුණාවෙන් සළකන්න.

15 මෙම ආයතනය තුල නිරීක්ෂණ කැමරා පද්ධතියක් ද සවිකර ඇති බව කරුණාවෙන් සළකන්න.

---

## කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

අයදුම්පත ලැබුණු දිනය . . . . . . . . . . . . අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ඇත / නැත.

වෙනත් කරුණු . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

භාවනා මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා යෝගියා විසින් පුණ්‍යාධාරයක් පිරිනමා ඇත්නම් මෙහි සඳහන් කළ යුතුය. රුපියල් . . . . . . . . . . . රිසිට්පත් අංකය . . . . . . . . . . . . . . . . . . . . . . . දිනය . . . . . . . . . . . . . .

කාර්යභාර නිලධාරි ගේ අත්සන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . දිනය . . . . . . . . . . . . . . . .

## කාම්මට්ඨානාචාර්යයන් වහන්සේගේ සටහන්

අනේවාසික භාවනා පුහුණුව සඳහා ඇතුලත් කරගන්න / ඇතුලත් කරගත නොහැක.

පැමිණීමට දැන්වියයුතු දිනය . . . . . . . . . .

භාවනා පුහුණුව පැවතෙන විටදී හා/හෝ පුහුණුව අවසානයේදී සටහන් සඳහා . . . . . . . . . . . . . . . . . .